# මිලින්ද මොරගොඩගේ "සතියේ සිතුවිල්ල" එළිදැක්වීම මාතරදී හෙට

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතා විසින් ඉරිදා ලංකාදීප පුවත්පතට ලියන ලද තීරු ලිපි ඇතුළත් " සතියේ සිතුවිල්ල" කෘතිය මාතර ඓතිහාසික බෝධිය අසලදී හෙට (16) නිකුත් කෙරේ.

ශ්‍රී රෝහණ සංඝ සභාවේ මහා නායක හා රුහුණ විශ්වවිද්‍යාලයේ කුලපති අත්තුඩාවේ සිරි රාහුල හිමියන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මෙම උත්සවයේදී අනුරාධපුර සාරානන්ද පිරිවෙන්පති පණ්ඩිත නැටවාකන්දේ ඥානානන්ද හිමියෝ විශේෂ දෙසුමක් පවත්වති.

මිලින්ද මොරගොඩ මහතා ඉරිදා ලංකාදීපයට වසර ගණනාවක් තිස්සේ ලියන ලද දේශපාලන හා ආර්ථික විෂයයන් 40කට අදාළ තීරු ලිපි මෙම කෘතියේ අන්තර්ගතය.




මාතර දිස්ත්‍රික්කයේ මහා සංඝරත්නය හා විද්වත්හුද පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් යාපා අබේවර්ධන හා මිලින්ද මොරගොඩ යන මහත්වරුන් ඇතුළු ආරාධිතයෝ රැසක්ද මෙම උත්සවයට සහභාගි වෙති.